# දරුවන් උදෙසා බයිබලයක්



# දාවිත් නම්වූ රජතුමා (පළමුවන කොටස)

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Lazarus
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර
ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

තරුණ දාවිත් සැඟවෙමින් පළාගියේය. සාවුල් රජුට ඔහුව
මරා දැමීමට අවශ්‍ය විය. දාවිත් ජීවත් වූයේ අනුගාමිකයන්
හාරසියයක් සමඟ පාළුකරයේ විශාල ගුහාවක් තුළය. ඔවුන්
සාවුල් රජුගේ සෙබළුන්ට අසුවීමට ඉතා ආසන්න අවස්ථා
ඇතිවිය. නමුත් දාවිත් දිගටම
සැඟවෙමින් ජීවිතය
බේරාගත්තේය.



පූජකයන් දාවිත්ට පැන යාමට උදව් කළ බව සාවුල්ගේ සේවකයා වන දොවෙග්, රජුට පැවසුවේය. සාවුල් ඔවුන්ව මරා දැමීමට අණ කළේය. නමුත් එය කිරීමට කැමති වූයේ දොවෙග් පමණි. ඔහු තම කඩුවෙන් පූජකවරුන් අසූපහක් සහ ඔවුන්ගේ පවුල් කුරිරු ලෙස ඝාතනය කළේය. එය ඉතා දුෂ්ඨ සිදුවීමක් විය.





දිනක් සාවුල්, දාවිත් සොයමින් යන අතර දාවිත් සහ ඔහුගේ මිනිසුන් සැඟවී සිටි ගුහාව වෙතට ගියේය. සාවුල් සිටියේ තනිවමය.

ගුහාව තුළදී දාවිත්ට පහසුවෙන්ම සාවුල්ව මරා දමන්නට තිබුණි. නමුත් ඒ වෙනුවට ඔහු වෙතට සෙමින් ළංවුන දාවිත්, සාවුල්ගේ ලිහිල් වස්ත්‍රයෙන් කොටසක් ඔහුගේ තියුණු කිනිස්සෙන් කපා ගත්තේය.



සාවුල් පිටත්ව ගිය විට දාවිත් ඔහුට කතා කළේය. “මම ඔබගේ සළුවෙන් කොනක් කපා ගත්තෙමි, නමුත් මම ඔබ නොමැරුවෙමි, මාගේ අතෙහි නපුරක් හෝ ඔබට විරුද්ධව කැරළි ගැසීමක් හෝ නොමැති බව දැනගන්න”.

සාවුල්, දාවිත්ට රිදවීමට උත්සාහ කිරීම ගැන කණගාටු වන බව කීවේය. නමුත් ඉක්මණින්ම, ඔහුගේ පැරණි කෝපය නැවත මතුවී, ඔහු දාවිත්ව ඝාතනය කිරීමට තුන්දහසක හමුදාවක් එකතු කළේය. එක් රාත්‍රියක, හමුදාව නිදා සිටින විට, දාවිත් සහ ඔහුගේ සොල්දාදුවෙකු වන අබිෂයි, රජුගේ කඳවුරේ සාවුල් නිදා සිටි ස්ථානයට රහසින් ගියෝය.





“දෙවියන් වහන්සේ අද
දවසේ ඔබේ සතුරා ඔබේ
අතට පාවා දුන් සේක”යි
අබිෂයි රහසින් කීවේය.
“කරුණාකර මට ඔහුට
හෙල්ලයෙන් එකවරම
පොළොවටම ඇනෙන
සේ පහර දීමට ඉඩ
දෙන්න: මට ඔහුට දෙවන
වර පහර දීමට සිදු
වන්නේ නැත.”



දාවිත් ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය.
සාවුල්ගේ හෙල්ලය සහ ජෝගුව
රැගෙන ඔහු කඳවුරෙන් පිටව ගියේය.
මාර්ගයෙන් එපිට කන්දක සිට දාවිත්
සාවුල්ට ඇසෙන තුරු කෑගැසුවේය.
දාවිත්ට ඔහුව මරා දැමිය හැකි වුවත්
එසේ නොකළ බව සාවුල් නැවත වරක්
දුටුවේය. නැවතත් සාවුල්, දාවිත්ට
රිදවීමට උත්සාහ කිරීම ගැන කණගාටු
වන බව පැවසුවේය. නමුත් සාවුල්ගේ
වචනය විශ්වාස කළ නොහැකි බව
දාවිත් දැන සිටියේය.



මේ වන විට සාමුවෙල් මිය ගොස් සිටියේය. ඔහු මුලින්ම සාවුල්වත්, පසුව දාවිත්වත් ඊශ්‍රායෙල්හි රජු ලෙස අභිෂේක කිරීමට දෙවියන්වහන්සේ විසින් තෝරාගත් අනාගතවක්තෘවරයාය. පිලිස්තිවරුන් ඊශ්‍රායෙලයට පහර දුන් විට, සාවුල් දරුණු දෙයක් කළේය. එය දෙවියන් වහන්සේ විසින් තහනම් කළ දෙයක් විය.

මියගොස් සිටින තැනින් නැවත සාමුවෙල් කැඳවන ලෙස සාවුල් කාන්තාවකට අණ කළේය. එදා රාත්‍රියේදී සාවුල්ට පණිවිඩයක් ලැබිණි.



“සමිදානන් වහන්සේ ඔබෙන් ඉවත්ව ඔබේ සතුරා වී සිටින සේක. ස්වාමින් වහන්සේ ඔබේ අතින් ඔබේ රාජ්‍යය උදුරා ඔබේ අසල්වැසියාට එනම් දාවිත්ට දුන් සේක. හෙට ඔබ සහ ඔබේ පුතුන් මා සමඟ සිටිනු ඇත. ස්වාමින් වහන්සේ ඉශ්රායෙල් හමුදාව ද පිලිස්තිවරුන්ගේ අතට පාවා දෙනු ඇත.” එය ඇසූවිට සාවුල් බියෙන් බිම වැතිරුණේය.



පිලිස්තිවරු ඊශ්‍රායෙල්වරුන්ට
විරුද්ධව සටන් කළ අතර
ඊශ්‍රායෙල්වරු පලා ගියෝය.
පිලිස්තිවරු දාවිත්ගේ මිතුරා
වූ ජොනතන්
ඇතුළු සාවුල්ගේ
පුතුන්ව මරා
දැමුවෝය.



සාවුල් දුනුවායන් අතින්
දරුණු ලෙස තුවාල ලැබීය.
තවද, ඔහු තමාගේ ආයුධ
දරන්නාට කතා කොට,
“මේ දුෂ්ට මිනිසුන් පැමිණ
මට පහරදී මට හිරිහැර
නොකරනු පිණිස, ඔබේ
කඩුව ඇද එයින් මට පහර
දෙන්නැ” යි කීවේය. නමුත්
ඔහුගේ ආයුධ දරන්නා ඊට
කැමති වූයේ නැත, මන්ද
ඔහු බොහෝ සෙයින් බියවූ
බැවිනි. එනිසා සාවුල්
කඩුවක් ගෙන ඒ පිට
වැටුණේය.





සාවුල්ගේ සහ ඔහුගේ
පුත්‍රයන්ගේ සිරුරු සොයා
ගත් පිලිස්තිවරු, ඔවුන්
විසින්  අල්ලාගත් ඊශ්‍රායෙල්
නගරයක තාප්පයේ සිරුරු
සවි කළහ. ඇතැම් නිර්භීත
ඊශ්‍රායෙල්වරු පිරිසක් මළ
සිරුරු එතැනින් ඉවත් කර,
ගෙනගොස් පුළුස්සා
ඊශ්‍රායලයේ තැන්පත්
කළෝය.



දාවිත් ඒ භයානක පුවත
අසා ශෝක වී හඬා
වැළපෙමින් මියගිය සාවුල්
සහ ඔහුගේ පුත්
ජොනතන් වෙනුවෙන්ද
ස්වාමින් වහන්සේගේ
සෙනඟ වෙනුවෙන්ද සවස්
වන තුරුම නිරාහාරව
සිටියේය.

සාවුල්, දාවිත් මැරීමට උත්සාහ කළද,
දාවිත් අවසානය දක්වා සාවුල්ව
දෙවියන් වහන්සේගේ අභිෂේක ලත්
තැනැත්තා ලෙස පිළිගෙන ගෞරව
කළේය. දෙවියන් වහන්සේ දාවිත්ට
ගෞරව කර සාවුල් වෙනුවට ඔහුව
රජකමට පත් කළ සේක.



දාවිත් නම්වූ රජතුමා (පළමුවන කොටස)

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

1 සාමුවෙල් 24-31,
2 සාමුවෙල් 1-2

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

# අවසානය

20

60

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)